# අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන් හෙළිවන නිරවද්‍ය පැවිදි ජීවිතය

*- වරකාවැහැර ධම්මපාල හිමි -*

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන් පැහැදිලි වන්නේ කුඩා රාහුල සාමණේරයන්හට නිරවද්‍ය පැවිදි ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා අදාළ වන පරිදි බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලද අවවාද සමූහයකි. රාහුල හිමියන් සත් අවුරුදු වියෙහි දී පැවිදි බව ලැබූ ඉතා විනීත නිහතමානී සාමණේර නමකි. උන්වහන්සේ දිනපතා උදෑසන වැලි දෝතක් ගෙන "මේ වැලිකැට ගණනට මට තථාගතයන් වහන්සේගෙන් හෝ ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලාගෙන් හෝ අවවාද අනුශාසනා ලැබේවා" යි ප්‍රාර්ථනා කරති.[1] උන්වහන්සේ අතිශයින්ම අවවාදක්ෂම වූහ. කීකරු වූහ. ළදරු රාහුල සාමණේරයන් හට තථාගතයන් වහන්සේ නිතර නිතර අවවාද දුන් සේක. කුඩා දරුවෝ නොදැන්වත්කම් නිසා නො දුටු දේ දුටිමියි ද, දුටු දේ නො දුටුමි යි ද පවසති. කෙළි පිණිස හෝ එබන්දක් රාහුල හිමියන් වෙතින් සිදු නො වේවා යි සිතා මෙම අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය[2] උන්වහන්සේ ගේ සත් අවුරුදු වියෙහි දී ම බුදුහු වදාළ සේක. එහි බොරු කීමේ ආදීනව අවබෝධ කරවීම සඳහා දක්වා තිබෙන දිය බඳුනෙහි උපමා සතර, යුද පිටියක් වන් ඇතෙකු පිළිබඳ උපමා දෙක සහ ආදාස (මුහුණ බලන කණ්ණාඩිය) උපමාව කුඩා දරුවන්ගේ සිත් ගන්නා සුළුය.

තව ද බුදුරජාණන් වහන්සේ රාහුල සාමණේරයන් අර්ථවත් කථා ඇති කුඩා හිමි නමක් බවට පත් කිරීම සඳහා දසවිධ සාමණේර ප්‍රශ්න[3] නිරතුරුව සිහිපත් කළහ. රාහුල හිමියන් ගේ වයස අවුරුදු දහ අටේ දී පමණ පස්කම් සුව පිළිබඳ ඡන්දරාගය දුරු කිරීම පිණිසත්, කල්‍යාණමිත්‍ර සම්පත්තියෙහි වැදගත් කම දැක්වීම පිණිසත් රාහුල සූත්‍රය[4] දේශනා කළහ. පසුව විදර්ශනා ප්‍රඥාව කුළුගන්වා රාහුල හිමියන්හට මගපල නිවන් සුව සාක්‍ෂාත් කරවීම සඳහා චුල්ලරාහුලෝවාද සූත්‍රය[5] සහ මහාරාහුලෝවාද සූත්‍රය[6] වදාළ සේක. උන්වහන්සේ අරහයා දේශනා කළ සූත්‍ර ධර්ම රැසක් මජ්ඣිම නිකාය (2) සහ (3), සංයුත්ත නිකාය (3) සහ (4), අංගුත්තර නිකාය (2), සුත්තනිපාතය යන ත්‍රිපිටක ග්‍රන්ථයන්හි සඳහන් වන අතර, අපදානපාලි (1), ථෙරගාථා සහ ශ්‍රාවකශ්‍රාවිකා චරිත යන කෘතීන්හි ද රාහුල තෙරුන් පිළිබඳ විස්තර සඳහන්ව ඇත.

### අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රසාරය

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ සිටින සමයෙහි එක් සන්ධ්‍යාවක අම්බලට්ඨිකා නම් පහයෙහි හුදකලාව හුන් සත් හැවිරිදි රාහුල සාමණේරයන් වෙත වැඩම කළහ. භාග්‍යවතුන් වහන්සේ දුර දීම දැක, රාහුල හිමියන් විසින් එළවා තැබූ පැන් බඳුනෙන් පා දොවා, පනවන ලද අසුනෙහි වැඩ සිටි සේක. ආයුෂ්මත් රාහුලයෝ ද භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රාහුල සාමණේරයන් අමතා දිය ස්වල්පයක් ඉතිරිව ඇති බඳුන පෙන්වමින් "රාහුලය, ඔබ මේ බඳුනෙහි ඉතිරිව තිබෙන දිය ස්වල්පය දක්නෙහි දැ" යි ඇසූ සේක. "එසේය ස්වාමිනි, දක්නෙමි" යි පිළිවදන් දුන් කල්හි "රාහුලය, යමෙකුට දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති ද ඔහුගේ මහණකමට අයත් ගුණ දහම් ද මෙසේ ම ස්වල්ප වේයැ" යි වදාළහ.

නැවත තථාගතයන් වහන්සේ බඳුනෙහි ඉතිරිව තිබූ දිය ස්වල්පය ද ඉවත දමා රාහුලයන් අමතා "රාහුලය, ඔබ මේ ඉවත දමන ලද දිය



ස්වල්පය දක්නෙහි ද? එසේය ස්වාමීනි, දක්නෙමි" යි පිළිතුරු දුන් කල්හි "රාහුලය, යමෙකුට දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති ද ඔහුගේ මහණකම ද මෙසේ ඉවත දමන ලද්දකැ" යි වදාළහ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ දිය බඳුන යටිකුරු කොට (මුනින් නමා) රාහුල තෙරුන්ගෙන් මෙසේ ඇසූහ. "රාහුලය, යටිකුරු කරන ලද දිය බඳුන දක්නෙහි ද? ස්වාමීනි, දක්නෙමි" යි පැවසූ කල්හි "රාහුලය, යමෙකුට දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති ද ඔහුගේ මහණකම ද (ගුණ ධර්ම නොරඳන බැවින්) මෙසේ යටිකුරු කරන ලද්දකැ" යි වදාළහ. ඉක්බිති තථාගතයන් වහන්සේ දිය බඳුන උඩුකුරු කොට තබා රාහුල හිමියන් අමතා "රාහුලය, ඔබ මේ උඩුකුරු කොට තබන ලද හිස් දිය බඳුන දක්නෙහි ද? එසේය ස්වාමීනි, දක්නෙමි" යි පිළිවදන් දුන් කල්හි "රාහුලය එමෙන් ම යමෙකුට දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැති ද ඔහුගේ මහණකම ද මේ හිස් බඳුන සේ ම මහණකමට අයත් ගුණයන්ගෙන් හිස් වූවකැ" යි පෙන්වා දුන් සේක.

රියකඳක් පමණ විශාල දළ ඇති, උස මහත ජාති සම්පන්න සංග්‍රාමයෙහි පුහුණු, රජතුමාගේ විශාල හස්ති රාජයා සංග්‍රාම භූමියෙහි දී ඉදිරි පය පසු පය හිස කඳ දෙ දළ දෙ කන හා වලිගය යන හැම අවයවයකින් ම සතුරන්ට පහර දෙයි. එහෙත් සොඬය මුබය තුළ රැවාගෙන එය පමණක් ආරක්ෂා කරයි. එකල්හි ඇත්ගොව්වාට මෙවැනි අදහසක් ඇති වෙයි. "මේ මහා හස්ති රාජයා ශරීරයෙහි සෑම අංගෝපාංගයක් ම උපයෝගී කර ගනිමින් සතුරන්ට පහර දෙයි. එහෙත් සොඬය පමණක් රකී. එබැවින් ඇතු තම ජීවිතාශාව අත් නො හළේය. කියා" ය. යම් හෙයකින්, යුදයට පිවිසි ඒ මහා හස්තියා සොඬයෙන් ද පහර දේ නම් එවිට ඒ ඇත්රජු වියරු වැටුණෙක් වෙයි. ජීවිතාශාව අත්හරන ලද්දෙක් වෙයි. සතුරු මිතුරු සැමට ම එතැන් සිට පහර දීම ඇරඹෙයි. එකල්හි ඇත් ගොව්වෝ ද ඌ අත්හැර දමති. මෙසේ වියරු වැටුණු ඇතුට ඒ අවස්ථාවේ දී කළ නො හැකි අපරාධයක් නැත. "රාහුලය, එපරිද්දෙන් යම් කිසිවෙක් මුසා බස් බෙණෙයි ද, ඔහුට මුසා බිණීමෙහි ලැජ්ජාවක් නැති ද, ඔහුට කළ නො හැකි කිසිදු පාපකර්මයක්

03 MAY 2012

නැත. එම නිසා රාහුලය, සිනහ පිණිසවත් බොරු නො කියන්නෙමි" යි හික්මිය යුතුය.

තව දුරටත් බුදුරජාණන් වහන්සේ ආදාස (කැටපත්) උපමාවෙන් කරුණු පැහැදිලි කරමින් "රාහුලය, ආදාසය කවර ප්‍රයෝජනයක් සඳහා ද? ස්වාමීනි, එය මුහුණෙහි හෝ සිරුරෙහි හෝ ඇඳුම් පැළඳුම්වල හෝ අඩු ලුහුඬු පිරික්සා බැලීම සඳහාය. රාහුලය, එසේ ම ධර්මය නැමති කණ්ණාඩියෙන් නුවණින් පිරික්සා බලා කයින් වචනින් සහ සිතින් කටයුතු කළ යුතු වෙයි."

රාහුලය, ඔබ යම් කලෙක කයින් කිසියම් කර්මයක් කරනු කැමැත්තෙහි ද, එසේම වචනයෙන් සහ සිතින් කිසියම් කර්මයක් කරණු කැමැත්තෙහි ද, ඒ කටයුත්ත නුවණින් සලකා බැලිය යුතුය. "මම කයින් (වචනයෙන් - සිතින්) මෙම කර්මය කරනු කැමැත්තෙමි. එය තමන් පෙළීම පිණිස පවතින්නේ වේ ද? අනුන් පෙළීම පිණිස පවතින්නේ වේ ද? දෙ පිරිස ම පෙළීම පිණිස පවතින්නේ වේ ද? එම කටයුත්ත අකුසල් ද, දුක් විපාක රැස්කරන්නේ ද යන්න නුවණින් පිරික්සා බලන ඔබ එබඳු කාය කර්ම (වචී කර්ම හෝ මනෝ කර්ම) ඒකාන්තයෙන් නො කළ යුතුය. එවැනි කටයුතු පිළිබඳ නුවණින් සලකා බලන විට එවැන්නක් තමන් වෙත ඇතැයි හැඟේ නම්, යුහුසුළුව එය ශාස්තෘන් වහන්සේට හෝ නුවණැති බ්‍රහ්මචාරීන් වහන්සේ නමකට හෝ කිව යුතුයි ප්‍රකට කළ යුතුයි. ආයති සංවරයට (නැවත එවැන්නක් නො කරමියි හික්මීමට) පැමිණිය යුතුය.

යම් හෙයකින් එම කාය කර්මය (වචී කර්මය හෝ මනෝ කර්මය) තමාට හෝ අනුන්ට හෝ දෙ පිරිසට ම හෝ දුක් පිණිස පීඩා පිණිස නො පවතින්නේ නම්, ඒවා කුසල්ය. සැප විපාක ගෙන දීම පිණිස පවතින්නේ ය. ඒ බව නුවණින් සලකා බලන ඔබ, එවැනි කායික වාචසික හෝ මානසික කර්ම නැවත නැවත කළ යුතුය. ඒ පිළිබඳ ප්‍රීති



ප්‍රමෝදය ඇති කර ගත යුතුය. රෑ දහවල් දෙකෙහිම කුසල ධර්මයන්හි හික්මිය යුතුය. මෙසේ කායික වාචසික හෝ මානසික හෝ කිසියම් කර්මයක් කිරීමට කැමැත්ත ඇති වූ කල්හි ද, කරන කල්හි ද, කොට නිම කළ කල්හි ද නුවණින් පරීක්ෂා කොට බලා එය අහිත පිණිස පවතී නම් අකුසල් නම් අත්හළ යුතුය. ආයති සංවරයෙහි පිහිටිය යුතුය. එය හිත පිණිස පවතී නම් කුසල් නම් අත් නො හළ යුතුය. නැවත නැවත කළ යුතුය. කුසල ධර්මයන්හී උද්‍යෝගය ඇති කර ගත යුතුය. රාහුලය, අතීත අනාගත හා වර්තමාන යන කාලත්‍රයට අයත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ එපරිද්දෙන් ම කයින් වචනයෙන් සිතින් පිරිසිදු කර්ම කළහ, කරන්නාහ. කරති. එසේ හෙයින් රාහුලය ඔබ ද නුවණින් පිරික්සා බලා කයින් වචනයෙන් හා සිතින් පිරිසිදු කර්ම කළ යුතුයැ යි වදාළ හ. එය ඇසූ රාහුල තෙරණුවෝ සතුටු සිතින් සාධුකාර දුන්හ.

**නිරවද්‍ය පැවිදි ජීවිතය**

ජීවිතයක නිරවද්‍යතාවය හැඩගැසෙන්නේ වරදින් ඈත් වන තරමටය. පුද්ගලයා වරදට පොළඹවන නීවරණ ධර්මයන්ගේ [7] සක්‍රිය බව තහවුරු කරනු ලබන්නේ අහිරික, අනොත්තප්ප දෙදෙනා විසිනි. සම්මා දිට්ඨිය පෙරගැමි කරගත් ප්‍රතිපදා මාර්ගයෙන් බැහැර වූ පුද්ගලයාට නිරවද්‍ය දිවි පෙවෙතක් ගොඩනගා ගැනීම අති දුෂ්කරය. හිරි ඔත්තප්පයන්ගේ ආකර්ෂණීය බලපෑමක් නොමැති තැන පුද්ගලයා සතු කායික, වාචසික හා මානසික ක්‍රියා ලෝභ ද්වේෂ මෝහයන්ට ගොදුරු වන බව කිව යුතුය. රාගයෙන් රත් වූ, ද්වේෂයෙන් දූෂිත වූ, මෝහයෙන් මුලා වූ පුද්ගලයා යුක්තියක් ධර්මයක් සාධාරණත්වයක් නො දකින්නේ එම නිසාය. පැවිදි දිවියෙහි නිරවද්‍යතාව සුරක්ෂිතව පවත්වා ගත හැකි වන්නේ පුද්ගලයා නොමගට යොමු කරවන රාග දෝස මෝහ යන බලධර්ම[8] පාලනය කර ගැනීමේ ශක්තිය මතය. ඒ සඳහා දැනුමක් මෙන්ම දැක්මක් ද තිබිය යුතුය. (ජානතොහං භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි)[9] ශාසනික ප්‍රව්‍රජ්‍යාව අනුදැන වදාළේ

ඒ සඳහා අදාළ පුණ්‍යක්ෂේත්‍රයක් වශයෙනි. සත්වයාට සකලක්ලේශයන් ප්‍රහාණය කොට මගඵල නිවන් සුව සාක්ෂාත් කරගැනීම පිණිස තෝතැන්නක් වශයෙන් පැවිද්ද අගය කළ හැකිය.

ශ්‍රමණ ජීවිතයෙහි ගුණාත්මක බව අර්ථවත් වන්නේ සිතත් කයත් දෙකම පැවිදි කරගත් විටය. කෙස් රැවුල් ඉවත් කොට ගිහි ඇඳුම් පැළඳුම් ඉවත් කොට කසාය වස්ත්‍ර හැඳ පොරවා ගැනීමෙන් සිදු කෙරෙන කායික පැවිද්ද සුළු මොහොතකින් ලබා ගත හැකිය. සිත පැවිදි කිරීම එසේ ලෙහෙසි පහසුවෙන් කළ හැකි දෙයක් නොවේ. දිගුකලක් සිත තුළ රජකම් කළ තෘෂ්ණා, මාන, දෘෂ්ටි, ඊර්ෂ්‍යා, මාත්සර්‍යාදී පාප පව්ටු ලාමක ධර්ම අනුක්‍රමයෙන් බැහැර කළ යුතුය. ඒ වෙනුවට ශ්‍රද්ධා වීර්‍ය ස්මෘති සමාධි ප්‍රඥාදිය[10] වර්ධනය කළ යුතුය. අප්පිච්ඡතා සන්තුට්ඨිතා සුභරතා භාවනාරාමතාදී[11] ශ්‍රමණ ගුණයන්ගෙන් සිත පෝෂණය කළ යුතුය. මත්ත හස්තියෙකු මෙන් රූපාදි අරමුණෙන් අරමුණට පනින සිත ඥානය නැමති අංකුසයෙන් නිශ්චල කළ යුතුය. (ඥානාංකුශෙන කර්තව්‍යං තස්‍ය නිශ්චලිතං මනඃ) සිත පැවිදි කළා වන්නේ එසේ ශික්ෂණයට පත් කිරීමෙන් ය. සිත පැවිදි වූ පසු පැවිදි දිවිය මිහිරක් වන්නේය. පර්‍යාප්තිය උගෙන ප්‍රතිපත්ය සපුරා ප්‍රතිවේදයට ළඟාවීමේ පිළිවෙත් මග ඔහුට සුවදායක වන්නේ ය.

සිත පැවිදි නොකර කයෙන් පමණක් පැවිද්ද ඇත්තාට පැවිදි දිවියෙහි මිහිරක් ආස්වාදයක් ලැබිය නොහැකිය. ඔහුට සිල් රැකීම, වත් පිළිවෙත් පිරීම, ධර්මය උගෙනීම, භාවනා කිරීම යනාදිය ඵල රහිත ක්‍රියාවෝය. ශ්‍රමණකෘතිය සම්පාදනය කිරීම හිරිහැරයක් කරදරයක් ලෙස වැටහෙන්නේය. ඔහු ඒවායින් හැකිතාක් ඈත්වීමට උත්සාහ දරයි. නැති අසනීප මවා පාමින් දවසේ වැඩි කාලයක් නින්ද සුවයෙන් කල් ගෙවයි. (උදරාවදෙහකං භුත්වාන සයන්තුත්තාන සෙය්‍යකා)[12] ලාභ, ලෝභ, කීර්ති, ප්‍රශංසා ලැබිය හැකි බණ පිරිත් බෝධි පූජා ආදිය සතුටින් බාර ගනියි. ඔහුට ප්‍රියවන්නේ ගිහියන්ටද සාධාරණ ඉන්ද්‍රියන් පිනවීමට ඉවහල් වන ස්ත්‍රී පුරුෂාදීන් පිරිවරාගෙන කරනු ලබන කිසියම් වැඩ කොටසක් වේ



නම් ඒවාය අශ්‍රද්ධාවත් ගිහි පැවිදි පිරිස් පිරිවරගෙන තිරශ්චීන කතාවෙන් කාලය කා දැමීම විනෝද ගමන් යෑම රසවත් ආහාර පාන වැළඳීම මිල මුදල් රැස්කිරීම රූපවාහිනිය, කැමරා, ඩෙක් යන්ත්‍ර හා විවිධ පහසුකම් ඇති ජංගම දුරකථන වැනි වටිනා භාණ්ඩ සපයා ගනිමින් ඒවායින් සතුටක් සැපතක් ආස්වාදයක් විඳගැනීමට ඔහු අභිරුචියක් දක්වයි. කයින් පමණක් පැවිදි වී බොළඳ ගිහි අභිප්‍රායන්ගෙන් සිත පුරවාගෙන සිටින පැවිද්දාට රිසි සේ ගිහි සැප විඳගැනීමට ද අවස්ථාවක් නො ලැබෙයි. පැවිද්දෙන් ලැබිය යුතු මහඟු ඵලයන් ද පරිහානියට පත්කර ගනියි. (ගිහීභොගාච පරිහීනො සාමඤ්ඤත්ථඤ්ච දුබ්භගො)[13]

පැවිදි ජීවිතයෙහි නිරවද්‍ය බව තහවුරු වීම සඳහා ආරම්භයේ පටන් සියල්ල පිරිසිදුව සම්පාදනය විය යුතුයි. 'සොධෙත්වා පබ්බාජෙථ සොධෙත්වා උපසම්පාදෙථ'[14] යනු පැවිදි කිරීමේ දී හා උපසම්පදා කිරීමේ දී අනුගමනය කළ යුතු ධර්ම නියාමය වන බැවින් කුල පුත්‍රයෙකු සසුන්ගත කිරීමට පළමුව විමර්ශනයට ලක් කළයුතු කරුණු රැසක් ඇත. එබැවින් සැමදෙනාම පැවිදි බව ලැබීමට සුදුස්සෝ නොවෙති. ධන්‍ය පුණ්‍ය සම්පත්තියෙන් යුත් සුදුස්සන් පමණක් තෝරා ගෙන පැවිදි කිරීම ශාසන බ්‍රහ්මචරියාව දිගුකල් පවත්වා ගැනීමට අනුග්‍රහයෙක් වෙයි. බුදුරදුන් පැවිද්ද අනු දැන වදාළේ සසර දුකින් එතෙර වීමට කැමති සැදැහැති[15] කුලපුත්‍රයන් සඳහාය. එසේ වුව ද සැමකල්හිම ශ්‍රද්ධාව එක පමණට නො පවති. පෘථග්ජන පුද්ගලයා තුළ පවතින ශ්‍රද්ධාව වරින් වර අඩු වැඩි වෙයි. ශ්‍රද්ධාවෙන් ම පැවිදි වන ඇතැම් පුද්ගලයෝ තම ආචාර්‍ය උපාධ්‍යාවරුන්ට පවා කීකරු නැති අසත්පුරුෂයන් බවට පත් වූ අවස්ථා දක්නට ඇත. අසත්පුරුෂයා තුළ ශ්‍රද්ධාව උත්සන්නව තිබෙන තුරු හොඳ පැවිද්දෙකි. ශ්‍රද්ධාව හීන වූ පසු එතෙක් සඟවාගෙන සිටි නපුරු ගති ප්‍රකට කරයි. අවවාද නො පිළිපදින නපුරු ගති ඇති අශීල පැවැතුම් ඇති ඇතැම් පුද්ගලයෝ කලක් පැවිදි වී සිටිය ද, දායකයන් බිඳවා ආවාසයටත් ගිනි තබා පලා ගිය මහාකාශ්‍යප මාහිමිපාණන් වහන්සේ ගේ අකීකරු ශිෂ්‍යනම[16] මෙන් සසුනටත් සමාජයටත් ස්වකීය ආචාර්‍ය උපධ්‍යායවරුන්ටත් මහත් අනර්ථයක් ම සිදු කරති. "අනුජානාමි භික්ඛවේ

අසම්මාවත්තන්තං පණාමේතුං" යනුවෙන් ආචාර්ය උපාධ්‍යායන් කෙරෙහි නිසි ගෞරවයක් නැති සුවච බවක් නැති අතවැසියන්ට නිග්‍රහ කොට සසුනෙන් බැහැර කිරීමට බලය දී ඇත්තේ ද එවිනි.

"මහණෙනි, කරුණු පසකින් යුත් අතවැසි තෙමේ බැහැර කළ යුතුය. ආචාර්යවරයා කෙරෙහි අධික වූ ගේහසිත ප්‍රේමයක් නොවේ ද, අධික වූ පැහැදීමක් නොවේ ද, අධික වූ ලජ්ජාවක් නොවේ ද, අධික වූ ගෞරවයක් නොවේ ද, අධික වූ මෛත්‍රී භාවනාවක් නොවේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් අතවැසි තෙමේ බැහැර කළ යුතුය"[17]

බුදුරජාණන් වහන්සේගේ මෙම ප්‍රකාශය අනුව ගුරුවරුන්ට අවනත නොවන අකීකරු පැවතුම් ඇති ශිෂ්‍ය භික්ෂු සාමණේරයන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය මැනවින් පැහැදිලි වෙයි. ආචාර්යවරුන්හට අවනතව සිටින පිළිවෙත් සරු අතවැසියන් බැහැර කිරීමෙනුත්, මනාකොට පිළිවෙත් නොපුරන අකීකරු අතවැසියන් බැහැර නොකිරීමෙනුත් ආචාර්යවරයාට දුකුළා ඇවැත් සිදුවන බව වදාරා ඇත. යමෙක් තමා වෙත ඇති කීමෙහි බිණීමෙහි හැකියාව හෝ වෙනත් දක්ෂතා ආදිය නිසා හෝ තමන් අන්‍යන් විසින් ගරු කටයුතු කෙනෙකු වශයෙන් සලකා, ගරු කටයුතු ගුරුවරාදීන් කෙරෙහි ගෞරවය නො කෙරේ ද යටහත් පැවතුම් නො දක්වා ද, අවවාදයට අනුශාසනයට අනුකූල නොවේ ද මානයෙන් මත් වූ ඔහු මහා අනුවණයෙකි. පුහුමානය පැවිද්දන්ට අනර්ථය පිණිස හේතු වන බවත් එවැන්නන් අන්‍යයන් ගේ පිළිකුලට සහ අප්‍රසාදයට පත් වන බවත් දත යුතු ය.

එබැවින් කුලපුත්‍රයෙකු පැවිදි කිරීමේ දී ඔහුගේ සැදැහැවත් බව පමණක්ම නොව අල්පේච්ඡතාව, ලද දෙයින් සතුටු වීමේ හැකියාව, පිරිස් සමග එක්වී අල්ලාප සල්ලාපයෙන් සිටීමට නොව විවේකීව



පැවිද්දට අදාළ කටයුතුවල නිරත වීමට ඇති රුචිකත්වය, වත් පිළිවෙත් කිරීමෙහි දක්ෂතාව, ධර්ම විනය ඉගෙනීමට හා භාවනා කිරීම ආදියට ඔහු තුළ පවත්නා උත්සාහය, වීර්යය, නුවණැති බව, තෘෂ්ණා මාන දෘෂ්ටීන්ට වසඟ නොවන බව යනාදී කරුණු පිළිබඳව ද සැලකිලිමත් වීම වඩාත් වැදගත්ය.[18]

විනය මහාවග්ග පාලියේ පැවිදි කිරීමය නුසුදුසු අභව්‍ය පුද්ගලයන් පැහැදිලිව හඳුන්වා දී ඇත. ඒ පණ්ඩකයා (ලිංග විකලත්වය ඇති පුද්ගලයා) උභතෝබ්‍යඤ්ජනකයා (ස්ත්‍රී පුරුෂ නිමිති දෙකම පිහිටා ඇති පුද්ගලයා) ථෙය්‍යසංවාසකයා (තමාම සිවුරු පොරවා ගෙන පැවිද්දෙකු සේ පෙනී සිට වස් ගණන් හඟවමින් ගිහි පැවිදි දෙපිරිසෙන් ම පුද පූජා ලබන පුද්ගලයා) තිත්ථියපක්කන්තකයා (කලක් පැවිදිව සිට පසුව තීර්ථක ප්‍රව්‍රජ්‍යාව හා ඔවුන්ගේ ආගමික මතවාද පිළිගත් පුද්ගලයා) තිරශ්චීනගතයා (නාග සුපර්ණ හො දේව බ්‍රහ්මාදි ආත්ම භාවයක් ලබා මිනිස් වෙස්ගත් පුද්ගලයා) මාතෘඝාතකයා (තම මව මැරීමෙන් ආනන්තර්ය අකුසලය කළ පුද්ගලයා) පිතෘඝාතකයා (තම පියා මැරීමෙන් ආනන්තර්ය අකුසලය කළ පුද්ගලයා) අරහන්තඝාතකයා (මනුෂ්‍ය ජාතික රහතන් වහන්සේ නමක් මැරීමෙන් ආනන්තර්ය අකුසලය කළ පුද්ගලයා) ලෝහිතුප්පාදකයා (ජීවමාන බුදුවරයකුගේ ශරීරයෙන් ලේ සෙල වූ පුද්ගලයා) සංඝභේදකයා (සංඝයා භේද කළ පුද්ගලයා) සහ භික්ෂුණී දූෂකයා (උපසපන් භික්ෂුණියක් දූෂණය කළ පුද්ගලයා) යන එකොළොස් දෙනාය.[19] මොවුහු උපතින් හා ක්‍රියාවෙන් පරිජි වූවෝය. මොවුන්ගෙන් කිසිවෙක් නො දැන පැවිදි කළහොත් පැවිද්ද නො පිහිටන්නේය. දැන දැන පැවිදි කළහොත් පැවිද්ද නො පිහිටනවා සේම පැවිදි කළ ආචාර්ය භික්ෂුවට ද ඇවැත් සිදුවන්නේය.

මෙම පුද්ගලයන්ට අමතරව, පැවිදි කළහොත් පැවිද්ද පිහිටන එහෙත් පැවිදි නොකළ යුතු පුද්ගලයෝ ද රැසක් වෙති. ඔවුහු නම් මාතාපිතුහි අනනුඤ්ඤාතො කුලපුත්තෝ[20] (මව්පියන් විසින් නො අනුදත් කුලපුත්‍රයා) පඤ්චහි ආබාධෙහි පුට්ඨො (කුෂ්ඨ, ගණ්ඩ, සුදු කබර, ක්ෂය

රෝගය හා අපස්මාරය යන පඤ්ච විධ රෝගාබාධ සහිත පුද්ගලයෝ) රාජභටො (රාජභටයා) ධජබන්‍ධො චොරො (සොරෙකු යැයි ප්‍රසිද්ධ පුද්ගලයා) කරභෙදකො චොරො (සිරගෙයින් බිඳ පලා ගිය සොරා) ලිඛිතකො චොරො (ඇල්ලීම සඳහා වරෙන්තු පනවා ඇති සොරා) කසාහතො (දඬුවම් පිණිස කස පහර ලැබූ පුද්ගලයා) ලක්ඛණහතො (දඬුවම් පිණිස ශරීරයෙහි ලකුණක් තබා ඇති පුද්ගලයා) ඉණායිකො (ණය ලබා ඇති පුද්ගලයා) දාසො (ප්‍රවේණි දාසයා) යනාදීන් ය. මේ හැරුණු විට අත් පා කන් නාසා ආදී ශරීරාවයවයන් කපන ලද පුද්ගලයා, එකට බැඳුණු ඇඟිලි ඇත්තා, කුදා, අඟුටුමිට්ටා, විරූපි පුද්ගලයා, අඳ ගොළු බිහිරි පුද්ගලයා අධික තරබාරු පුද්ගලයා ශරීරයේ ඇට සම් පමණක් ඇති අධික කෘශ පුද්ගලයා යන මොවුහු ද පැවිදි නොකළ යුතු පුද්ගලයන් වශයෙන් නම් කර ඇත. ශරීරයෙහි මෙවැනි අඩු ලුහුඬුකම් ඇති පැවිද්දන් දකින අන් අය ඒවා විහිලුවට ලක් කිරීමෙන් පව් සිදු කරගන්නාහ. එබැවින් ඔවුන් පැවිදි නො කළ යුතු බවත් පැවිදි කළ විට ආචාර්යවරයාට දුක්කටාපත්ති සිදුවන බවත් සඳහන්ව ඇත.[21]

ශාරීරික ස්වභාවය යහපත් වූ පමණින් ම සාර්ථක පැවිදි ජීවිතයක් ගොඩනගා ගැනීම දුෂ්කරය. දිවි පැවැත්මෙහි නිරවද්‍යතාවය ද ඒ සමග සහ සම්බන්ධ විය යුතුය. පැවිදි වන කුලපුත්‍රයාට පැවිද්දෙහි අගය පළමු කොට වටහා දිය යුතුය. ශරීරය පෝෂණ කිරීම සඳහා, මිල මුදල් උපයා ගැනීම සඳහා, අඹුදරුවන් හදා වඩා ගැනීම සඳහා පස්පව් දස අකුසල් ත්‍රිවිධ දුෂ්චරිතයන්හි යෙදෙන, මිනිසුන් ගෙන් පිරී සිටින ලෝකයෙහි පැවිද්දා දිවි හිමියෙන්ම සතුන් මැරීම සොරකම සුරාපානය දුරාචාරය මුසාවාදය වැනි පව්වු ලාමක ක්‍රියාවන්ගෙන් වෙන්ව සිටීම ගරුබුහුමන් ලැබීමට සුදුසු වන්නේ ය. මව්පියන් අඹුදරුවන් නෑ හිත මිත්‍රාදීන් සහ දේපළ ධන ධාන්‍ය හැර දමා කිසියම් කුලපුත්‍රයකු පැවිදි වන්නේ නම්[22] ඒ දුෂ්කර ක්‍රියාව කළ පැවිද්දා සමාජයෙන් පුද පූජා ලැබිය යුත්තෙකු නො වන්නේ ද? බුදුරදුන්ගේ ධර්මය උගෙන ඒ උතුම් ධර්මයට විනයට අනුව ජීවිතය හැඩගස්වා ගනිමින් ජනයාගේ දෙලෝ යහපත පිණිස



නිවන් මග පාදා ගැනීම පිණිස සදහම් පණිවුඩය බෙදා දෙන පැවිද්දාගෙන් ලොවට සිදුවන සේවය අසීමිතය. දහම් දෙසීම ආදී මහජන කටයුතු කිසිවක් නො කොට මහණකමේ කටයුතු වල පමණක් නිරත වී සිටින සිල්වත් ගුණවත් පැවිද්දාගෙන් ද ලොවට සිදුවන යහපත අතිමහත් ය. මේ තෙම සිල්වතෙක ගුණවතෙක යැයි සිතා යමෙක් ඔහු කෙරෙහි සිත පහදවා ගෙන මෛත්‍රී සහගත සිතින් බැලීම පවා සග්ග සංවත්තනික (දෙව්ලොව ඉපදීමට හේතු වන) කුසලයක් බව මංගල සූත්‍ර අටුවාව දක්වා තිබේ.[23]

ලෝකයෙහි සෑම කෙනෙක් ම ධනවත් වීමට ප්‍රිය කරති. රන් රිදී මුතු මැණික් වස්ත්‍රාභරණ ගෙවතු කුඹුරු හරකාබාන යානවාහන ආදිය සාමාන්‍ය මිනිසා සතු වටිනා ධනය වශයෙන් සැලකෙයි. පැවිද්දා සතු ධනය ශ්‍රද්ධාශීලාදී ගුණ ධර්මයෝ ය. දිවි හිමියෙන් ම සිල් රක්නා පැවිද්දා සතු ධනය ශ්‍රද්ධාශීලාදි ගුණ ධර්මයෝය. දිවි හිමියෙන්ම සිල් රක්නා පැවිද්දා තුළ බුද්ධාදී මහෝත්තමයන්ගේ පවා පැසසුමට ලක් වූ සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤාදී අපමණ ගුණස්කන්ධයක් ඇත. එබැවින් සතයකු ද නැති පැවිද්දා ද ගුණ නැමති මහා ධනස්කන්ධයක් ඇත. එබැවින් සතයකු ද නැති පැවිද්දා ද ගුණ නැමැති මහා ධනස්කන්ධයට උරුමකම් කියන්නෙකි. සුපේෂල ශික්ෂාකාමී පැවිද්දෙකුගේ තබා ශ්‍රමණ දුශ්ශීලයා කෙරෙහි ද ගුණ දශයක් ඇති බව මිළින්දපඤ්හය පවසයි.

මහරජ මේ සස්නෙහි ශ්‍රමණ දුශ්ශීල තෙමේ ද
බුදුන් කෙරෙහි ගෞරව ඇත්තේ වේ. ධර්මය
..... සංඝයා.... ආචාර්යෝපාධ්‍යායන් කෙරෙහි
ගෞරව ඇත්තේ වේ. පෙළ අටුවා උගෙනුමට
උත්සාහ කරන්නේ වෙයි. බොහෝ කොට බණ
අසන්නේ වෙයි. බිඳුණු සිල් ඇත්තේ ද පිරිස්
මැදට ගියේ ශ්‍රමණ ආකල්පය දරන්නේ වේ.
නින්දාවට බියෙන් කය වචනය දෙක රකින්නේ

02 MAY 2012

වෙයි. ඔහුගේ සිත ප්‍රධානාභිමුඛව පවත්නේ වේ. භික්ෂුවක යන සංඛ්‍යාවට පැමිණ සිටින්නේ වේ. ශ්‍රමණ දුශ්ශීලයා පව් කරන විට ද සැමියෙකු ඇති ස්ත්‍රිය රහසිගතව පාප ක්‍රියාවෙහි යෙදෙන්නාක් මෙන් සැඟ වී සිට පව් කරන්නේ වේ. මහරජ, ගිහි දුශ්ශීලයාට වඩා මේ ගුණ දශය අතිරේක වශයෙන් ශ්‍රමණ දුශ්ශීලයා කෙරෙහි පිහිටා ඇත්තේය."[25]

දුසිල් පැවිද්දා කෙරෙහි ද මෙසා විශාල ගුණ සමුදායක් ඇති කල්හි සසර බිය දක්නා සුළු සුපේෂල ශික්ෂාකාමි පැවිද්දාගේ ගුණ පිළිබඳ කවර කථා ද? මහත් වූ ගුණස්කන්ධයකට හිමිකම් කියන බැවින් පැවිද්දාගේ තත්වය ගිහියාට වඩා ඉතා උසස්ය. ඒ බව නොදත් ඇතැම් පැවිද්දෝ ගිහි සැප කෙරෙහි ලොල් වී මිරිඟුව හඹා දුවන මුව රැනක් මෙන් පැවිදි දිවියෙහි ආස්වාදයක් නොලබා කලක දී සිවුරු හැර යන්නාහ. ඇතැම්හු මහණකමේ සිත් අලවා විසීමට තරම් රුචිකත්වයක් නැත ද සිවුරු හැර ගියහොත් සමාජයෙන් ගැබිය හැකි ගැරහුම් අපවාද වලට ඇති බිය නිසා ගිහිකමටත් පැවිදිකමටත් නැති දෙබිඩි ජීවිතයක් කුසීත ජීවිතයක් හීන ජීවිතයක් ලාමක ජීවිතයක් ගත කරති. (දුක්ඛං භික්ඛවේ කුසීතො විහරති වොකිණ්ණො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි)[26] ශ්‍රද්ධාව පිරිහී භක්තිය හීන වී මිථ්‍යාමත වැරදි කල්පනා අශාසනික අදහස් වලින් හිස් පුරවාගත් ඇතැම්හු තමන්ට පමණක් නොව සිවුරටත් ශාසනයටත් සංඝයාටත් සමාජයටත් සාපයක් ලෙස ජීවත් වෙති. ඇතමෙක් නැති ගුණ අඟවමින් බොරු සිල් පෙන්වමින් වස්තුව උපයමින් කුහක ප්‍රතිපත්ති ලාමක ගති පැවැතුම් ඇතිව ජීවත් වෙති. යස ඉසුරු සැප සම්පත් ලාභ ලෝභ කීර්ති ප්‍රශංසා (දාරුණො භික්ඛවේ ලාභසක්කාර සිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛේමස්ස අධිගමාය)[27] වැඩි වැඩියෙන් අපේක්ෂා කරන මොවුහු ශ්‍රමණ ප්‍රතිරූපකයන් වශයෙන් හැඳින්විය හැකිය.



නිවද්‍ය පැවිදි ජීවිතයක් ගොඩනගා ගත හැකිවන්නේ පැවිද්දාගෙන් ලොවට සිදුවන යහපත අවබෝධ කරගත් විටය. දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ යන ත්‍රිවිධ සම්පත්තිය සාදා දීමට සමත් අත්‍යුත්ම බුද්ධභාෂිතය අතුරුදහන් වන්නට නොදී පරපුරෙන් පරපුරට පවත්වා ගෙන යෑම පැවිද්දාගෙන් සිදු වන සුවිශාල කාර්යභාරයකි. ව්‍යක්ත විනීත විසාරද බහුශ්‍රැත ධර්මධර ධර්මානුධර්ම ප්‍රතිපන්න[28] පැවිද්දන්ගේ ඇසුර ලබන බොහෝ දෙනා ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥාදී ගුණ ධර්ම වඩා වර්ධනය කොට සම්මෝහය දුරුකර ගනිති. දාන සීල භාවනාදී තුන් පින් කිරිවත් සපුරා දොලෝ දියුණුව සකසා ගනිති. සෝවාන් ආදී මගපල ලබා නිවන් පසක් කර ගනිති. තවත් සමහර පැවිද්දන් වෙතින් සිප්සතර හදාරා දිවිමග සාර්ථක කර ගනිති. සිල්වත් ගුණවත් උගත් බුද්ධිමත් භික්ෂුවක වශයෙන් පැවිදි ජීවිතය පවත්වා ගෙන යෑමෙන් තමාට පමණක් නොව සසුනටත් සමාජයටත් ඉමහත් යහපතක් සිදු කළ හැකි බව සිහිපත් කළ යුතුය.

ශාසනික ප්‍රතිපත්තිය තුළ උසස් පැවිද්දන් වශයෙන් පිළිගැනුනේ පදවි තානාන්තර වත්පොහොසත්කම් පණ්ඩිත උපාධි වැනි දෑ ඇත්තන් නොව ධ්‍යාන අභිඥා හා මාර්ගඵලලාභී සිවු පිළිසිඹියා පත් නික්ලේශී උතුමන්ය. අද එබන්දන් සුලබ නොවූවත් ලෝකයෙහි කොතැනක වත් මාර්ගඵල සාක්ෂාත් කරනයෙහි නියැළුණු උත්තමයන් නැතැයි කිසිවෙකුටත් නිගමනය කළ නො හැකිය. වර්තමාන පැවිදි සමාජය අනුව සලකන විට රූපයෙන් කට හඬින් බොළඳ වදනින් කළු සිවුරෙන් මිනිසුන් පහදවා ගෙන සැලකිල්ල සත්කාර කීර්ති ප්‍රශංසා ලබා ගැනීම සඳහා කුහකකම් නොකරන, පාපිච්ඡතාවෙන් තොරව (ලාභසක්කාරසිලොක නිකාමතාය අසත්තගුණ සම්ධානාධිප්පායො පාපිච්ඡො)[29], තමාට අයත් සිකපද කඩා බිඳ නො ගෙන, නො දැනුවත්ව හෝ කැඩුනු සිකපද වෙතොත් ප්‍රතිකර්ම කර ගෙන (අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පතිකරොති) අභිධර්මයට හා අභිවිනයට මුල් තැන දී (අභිධම්මේ අභිවිනයෙ යොගො කරණීයො)[30] සැලකිලිමත්ව බණදහම් උගෙන, වත් පිළිවෙත් සරුව භාවනාරාමතාදී ශ්‍රමණ කෘතියෙහි යෙදෙමින්

තෘෂ්ණා මාන ඊෂ්‍යා වෛරාදී කෙලෙසුන්ගේ ඕලාරික පැවැත්ම තුනී කරගෙන, මෛත්‍රී කරුණාදී ගුණ දියුණු කරගෙන සිටින පැවිද්දා උසස් පැවිද්දෙකු බව කිව යුතුය. සුව පහසුව ප්‍රණීත ආහාරපාන කීර්ති ප්‍රශංසා වැඩි වැඩියෙන් සෙවීමට පුරුදු වී සිටීම උසස් පැවිද්දෙකු වීමට මහත් බාධාවක් බව සැලකිය යුතුය.

නිරවද්‍ය පැවිදි ජීවිතයක් ගොඩනගා ගන්නේ කෙසේ ද? ඒ සඳහා බුදුදහම විසින් ඉදිරිපත් කෙරෙන නිර්ණායක මොනවා ද? එහි සීමාවන් කවරේ ද? යන්න තීරණය කිරීමට හොඳම ප්‍රකාශය සඳහන් වන්නේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙහිය. ඒ අනුව "කයින් වචනයෙන් සිතින් යමක් කරන විට කියන විට සිතන විට, එය තමාගෙත් අන්‍යයන්ගේත් අහිත පිණිස අයහපත පිණිස පවතී නම් එය අකුසල්ය. නො කළ යුතුය. දෙපිරිසෙහි ම හිත සුව පිණිස පවතී නම් එය කුසල්ය. කළ යුතුය. යමක් කිරීමට පළමුවත් කළ පසුත් නැවත නැවත තමා කළ කී දේ ගැන විමසා බලා, අකුසලයක් යැයි හිතට එකඟව වැටහේ නම් එය නැවත නො කොට අත්හැර ආයති සංවරයෙහි පිහිටිය යුතුය. කුසලයක් යැයි සිතට එකඟව වැටහේ නම් එය අත්නොහැර නැවත නැවතත් සම්පාදන කරමින් සතුට ප්‍රමෝදය ඇතිකර ගත යුතුය"[31] මෙහි දී නො කළ යුතු දෑ වශයෙන් අකුසලයත්, කළ යුතු දෑ වශයෙන් කුසලයත් අවධාරණය කර ඇත. තවද අකුසලය කිරීමේ අයහපතත් කුසලය කිරීමේ යහපතත් ප්‍රකට කර ඇත. කුසල් අකුසල් රැස් කරන ද්වාර වශයෙන් කය වචනය හා සිත යන ස්ථාන තුන නම් කර ඇත. මිනිස් සිරුරට ප්‍රතිබද්ධව පවත්නා මෙකී ද්වාරත්‍රය හැර වෙනත් මගකින් කුසලාකුසල කර්ම රැස් කළ නො හැකිය. ඒ අනුව කුසලාකුසල කර්ම රැස්කිරීම පිළිබඳ නිර්ණායකය වන්නේ තමන්ටත් අන්‍යයන්ටත් මෙලොවටත් පරලොවටත් හිත සුව පිණිස පවතින, එසේ ම නිවන් පිණිස උපනිස්සය වන දෑ කුසල කර්ම වශයෙන් සැලකීමය. එසේ හිතසුව පිණිස නො පවතින දෑ අකුසල කර්ම වශයෙන් සැලකීමය. කුසල් අකුසල් පිළිබඳ බෞද්ධ මිනුම් ඒකකය එය වන අතර කය වචනය සහ සිත කුසලාකුසල කර්ම නිපදවීමෙහි ලා ද්වාරභාවයෙන් උපකාර වන බව කිව යුතුය.



අකුසලය යනු කුමක් ද? කුසලය යනු කුමක් ද? කුසලාකුසලයන්ගේ ස්වභාවය හටගැනීම හා පැවැත්ම කවරේදැයි ප්‍රථමයෙන් විමසා බැලීම සුදුසු යයි සිතමු. අකුසලයට මුල් තුනක් ඇත. ලෝභය ද්වේෂය මෝහය යනුවෙනි. (තීණි අකුසල මූලානි ලොභො දොසො මොහො)[32] එසේම කුසලයට ද මුල් තුනක් ඇත. අලෝභය අද්වේෂය අමෝහය යනුවෙනි. (තිණිමානි භික්ඛවේ කුසලමූලානි....)[33] ලෝභයේ ස්වභාවය නම් අරමුණෙහි ඇලීම හෙවත් ආශාවයි. රත් වූ තැටියකට දැමූ මස් වැදැල්ල පිච්චි පිච්චි එහිම ඇලෙන්නාක් මෙන් ඇස් කන් නාසාදී ඉන්ද්‍රියන් මගින් ගත් රූප ශබ්දාදී අරමුණෙහිම ඇලෙමින් දුක් වේදනා විඳිමින් පවා ඒ මගින් සැප ලබා ගැනීමේ ආශාව ජනිත කර වන්නේ ලෝභයයි. එම ලෝභය තණ්හාව කාමය රාගය සෙනෙහස යනාදී නම් රාශියකින් හැඳින්වෙයි. ද්වේෂයේ ස්වභාවය නම් අරමුණ හා ගැටීම හෙවත් පිළිකුලයි. විෂ බින්දුවක් මෙන් පැතිර යමින් කුපිත වූ පුද්ගලයා දවාලන්නේ ද්වේෂය යි. එම ද්වේෂය තරහාව වෛරය කෝපය ප්‍රචණ්ඩත්වය නො කැමැත්ත යනාදී විවිධ නම්වලින් හැඳින්වෙයි. මෝහයේ ස්වභාවය නම් අරමුණෙහි මුලාව හෙවත් අනුවණ බවයි. කරුණුවල යථා ස්වරූපය පිරික්සා නො බලා අන්ධභාවයට පත්වූවෙකු මෙන් පුද්ගලයා ක්‍රියා කරවන්නේ මෝහය යි. එම මෝහය නො දැනීම මෝඩකම අවිචාරවත් බව නුනුවණකම යනාදි නොයෙක් නම්වලින් හැඳින් වෙයි.

අර්ථවත් බැවින් හා ප්‍රායෝගිකත්වයෙන් සපිරුණු ඉෂ්ට විපාක ජනනය කිරීමේ ශක්තියෙන් යුත් කුසල පාක්ෂික ධර්මයක් වූ අලෝභයේ ස්වභාවය නම් අරමුණෙහි නො ඇලීම හෙවත් ආශාවෙන් තොර බවයි. නෙළුම් පතෙහි දිය බිඳුව මෙන් අරමුණේ නො ඇලෙයි. පරිත්‍යාගශීලී බව ප්‍රකට කරයි. අද්වේශයේ ස්වභාවය නම් අරමුණෙහි නො ගැටීම හෙවත් මිත්‍රශීලි බවයි. කළණ මිතුරෙකු මෙන් අවිරෝධය ලක්ෂණ කොට පවතියි. ක්ෂාන්තිය හෙවත් ඉවසීම ප්‍රකට කරයි. අමෝහයේ ස්වභාවය නම් අරමුණෙහි මුලා නො වීම හෙවත් ඥානාන්විත බවයි.

පහනක් මෙන් අඳුර පහ කොට නිවැරදි මග දක්වන්නේ අමෝහයයි. විචක්ෂණශීලිත්වය ප්‍රකට කරයි. මෙම කුසලාකුසල ධර්මයන්ගේ සීමා නිර්ණය වන්නේ ඒවායෙන් ලැබෙන ඉටු අනිටු ප්‍රතිඵලයන්ගේ විස්තීර්ණත්වය අනුවයි. මෙලොව හා පරලොව සුවය සාදා දීම කුසලයාගේ අවම ශක්‍යතාව පිළිබඳ සීමාවයි. එහි උපරිමය අනුපාධිසේස පරිනිර්වාණය යි. අත්තානුවාද භය පාරානුවාද භය සහ දණ්ඩ භය[34] වැනි භය මෙලොවදී ම ලබා දීම අකුසලයේ අවම සීමාවයි. තිරිසන් ප්‍රේත අසුර නිරයාදි දුර්ගති භවයන්හි උපත ලබා දී කල්ප ගණන් කටුක දුක් විපාක විඳීමට සැලැස්වීම අකුසලයේ උපරිම සීමාවයි.

මේ අනුව කුසලය යනු ලෞකික ලෝකෝත්තර සැප ලබා දීමට සමත් සුවිශේෂි වූ සදාචාරාත්මක වටිනාකමක් දනවන්නක් බව පැහැදිලි වෙයි. තව ද තමන්ට හා අන්‍යයන්ට යන උභය පක්ෂයටම හිතකර කාර්‍ය්‍ය කුසලය ලෙස සැලකීම නිසා බුදුදහම ආත්මාර්ථය හා පරාර්ථය යන දෙකටම සමාන අගයක් ප්‍රදානය කරන බව පෙනෙයි. ස්වාර්ථයෙහි මෙන් ම පරාර්ථයෙහි ද යෙදෙන්නා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වශයෙන් බුදුදහම පිළිගනු ලබන්නේ එම නිසාය.[35] බුදුසමයෙහි ඉගැන්වෙන සදාචාරාත්මක යෙදුම් අතර කුසල සංකල්පය උපරිම වැදගත් තැනක් හිමි කර ගනියි. එයට හේතුව පුණ්‍ය ශක්තියට වඩා වැඩි බලයක් කුසල ශක්තිය තුළ පැවතීමයි. එහෙත් ඇතමෙක් කුසලය හා පින සමානාර්ථවත් ලෙස අවිශේෂයෙන් සැලකීමට පුරුදු වී සිටින බව පෙනේ. උපයෝගිතාව අනුව සලකන විට පිනට වඩා කුසලයත් පවට වඩා අකුසලයත් පුළුල් අදහසක් දරන බව පිළිගත යුතුය. (කුසලය හා පින වෙන් වෙන් වශයෙන් හඳුන්වා දීමට දීර්ඝ විවරණයක් කළ යුතු බැවින් මෙහිදී ඒ පිළිබඳ අවකාශ මද බව සඳහන් කරමු.)

අකුසල මූල කුසල මූල යන්නෙහි "මූල" යන පදයෙන් අර්ථවත් වන්නේ කුසලාකුසල බලවේග ස්ථිරව දරා සිටීමේ ශක්තියයි. කුසලාකුසලයන් නිර්මාණය කිරීමෙහි හැකියාව නැතහොත් හේතුවයි.



කුසලාකුසලයන් පෝෂණය කිරීම සඳහා ජීව ශක්තිය ප්‍රවාහනය කරන සාධක ලෙස ද "මූල" යන්න සඳහන් කළ හැකිය.[36] කුසලය යනු දොස් රහිත (අනවජ්ජ) හෙවත් සුචරිතයට බර සුඛ විපාක සාදා දෙන මානසික බලවේගය යි. අකුසලය යනු දොස් සහිත (සාවජ්ජ) හෙවත් දුසිරිතයට බර දුක් විපාක සාදා දෙන මානසික බලවේගය යි. ලෞකික සැප විපාක ගෙන දීමට සමත් කුසලය ලෝකෝත්තර පක්ෂය භජනය කිරීමේ දී දක්ෂ කෞෂල්‍යය (කෝසල්ල) කෘතහස්ත යන අර්ථයෙන් ද භාවිතා වන අවස්ථා දක්නට ලැබේ.[37] අකුසල යන්නෙන් කුසලයට ප්‍රතිවිරුද්ධ අර්ථය නිරූපණය කෙරෙයි. දුගතිගාමී ප්‍රතිවිපාක සැලසීමේදී අදක්ෂ අකෞෂල්‍යය සහ සබ්‍යාපාද (සබ්‍යාපජ්ජ) යනාදී අරුත ගෙන දෙයි. පුද්ගලයා විසින් හිතාමතා සිදුකරන කුසලාකුසලයන් ප්‍රතිඵල ලබාදීමේ ශක්තිය ජනනය කරන බැවින් කර්ම සංඛ්‍යාවෙහි ලා ඇතුළත් වේ. (චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා)[38] කුසල් - අකුසල් සිදු කිරීමේ හැඟීම හෙවත් මානසික අවශ්‍යතාව, ඒ අනුව ක්‍රියාත්මක වීමේ අභිප්‍රාය චේතනාව නමින් හැඳින්වෙයි. චේතනාව කර්මයක් බවට පත්වීම සඳහා චේතනාව සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ද උපස්තම්භනය ලැබිය යුතුයි. එසේ නොමැතිව හුදෙක් චේතනාව පමණක් ම කර්මයක් බවට පත් නොවේ.

චේතනා සම්ප්‍රයුක්ත ධර්ම සියල්ල එක් විස්සක් සේ දැක්වෙයි.[39] ඒවයින් අනභිද්ධ්‍යා, අව්‍යාපාද සම්‍යක් දෘෂ්ටි යන තුන සහ බොද්ධ්‍යංග ධර්ම සතය මාර්ගාංග අටය යන මෙම පසළොස කුසල පක්ෂයෙහි චේතනා සම්පයුක්ත ධර්මයෝය. අකුසල පක්ෂයේදී අභිද්ධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන තුන චේතනා සම්පයුත්ත ධර්මයෝය. මොවුන්ගේ ආසේවනය ලබන කුසලාකුසල චේතනාවෝ විපාක ගෙන දීමේ ශක්තිය ඇති කුසලාකුසල කර්ම රැස් කරති. කුසල කර්ම අකුසල කර්ම වශයෙන් දෙවැදෑරුම් වූ එම කර්ම අතර ප්‍රවෘත්ති විපාක පමණක් ලබා දෙන කර්ම ද, ප්‍රතිසන්ධි විපාක පමණක් ලබා දෙන කර්ම ද, ප්‍රවෘත්ති විපාක සහ ප්‍රතිසන්ධි විපාක යන දෙකම ලබාදෙන කර්ම ද පවතී. කාම රූප අරූප යන භවත්‍රයෙහි උප්පත්තිය ලබා දීමේ ශක්තිය පවතින්නේ

02 MAY 2012

ප්‍රතිසන්ධි විපාකයන් තුළය. කිසියම් භවයක උපන්නහුට සැප හෝ දුක් ලබාදීමේ ශක්තිය පවතින්නේ ප්‍රවෘත්ති විපාකයන් තුළය. එම දෙකම ලබාදීමේ ශක්තිය ඇති කර්මයන් කර්මපථ නමින් හැඳින්වේ. මේවායින් අකුසල කර්ම ඒකාන්තයෙන්ම නො කළ යුතු (සසක්කං න කරණීයං) කර්ම වශයෙන් ද, කුසල කර්ම කළ යුතු (කරණීයං) කර්ම වශයෙන් ද, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය හඳුන්වයි. බුදුසමය තුළ කුසල කර්ම බහුල වශයෙන් කළ යුතු යැයි (කත්තබ්බං කුසලං බහුං)[40] අවධාරණය වීමට හේතුව නම් දුශ්චරිත සංක්ලේශ විශෝධනය (දුච්චරිත සංකිලෙස විසොධනං) හෙවත් දුසිරිත් පිරිසිදු කිරීමේ ශක්තිය කුසල ධර්මයන් සතුව පැවතීම යි.

රාගයෙන් රත් වූ ද්වේෂයෙන් දූෂිත වූ මෝහයෙන් මුලා වූ මානසික තත්වයන් මත සිදු කෙරෙන අකුසල ක්‍රියා මගින් පුද්ගල අදක්ෂතාව (අකොසල්ලසංභූතට්ඨෙන අකුසලං)[41] අගරුතාව අමනෝඥතාව මනා ලෙස පිළිබිඹු කෙරෙයි. කායික වාචසික වශයෙන් සිදුවන ඕලාරික සාවද්‍ය ක්‍රියා හැරුණු විට මෙනෙහි නොකළ යුතු නීවරණ පාක්ෂික කරුණු මෙනෙහි කිරීමෙනුත්, මෙනෙහි කළ යුතු අනිත්‍යප්‍රතිසංයුක්ත ධර්ම මෙනෙහි නො කිරීමෙනුත් අනුසය ධර්මයන්ගේ ප්‍රවර්ධනය සිදුවන බව බුද්ධ දේශනාවන් හි සඳහන් වේ. (යෙ ධම්මා න මනසිකරණීයා තෙ ධම්මෙ මනසි කරොති, යෙ ධම්මා මනසිකරණීයා තෙ ධම්මෙ න මනසිකරොති)[42] කායිකව වාචසිකව හා මානසිකව සිදු කෙරෙන සියලු දුසිරිත් දුරාචාර පාලනය කිරීමේ ශක්‍යතාව උපරිම අයුරින් ගොඩනගා ගැනීමේ හැකියාව පවතින්නේ අධිසීල අධිචිත්ත අධිපඤ්ඤා සංඛ්‍යාත ත්‍රිශික්ෂාවෙහි[43] නිරතුරුව හික්මෙන භික්ෂුවක් තුළ ය. ඒ සඳහා යෝනිසෝ මනසිකාරය (සහේතුක සම්මර්ශනය) මෙන් ම අධිෂ්ඨාන ප්‍රතිබද්ධ වීර්‍ය්‍යය ද ඔහු සතුව තිබිය යුතුය. මිනිස් සිතෙහි පවත්නා සාධනීය ශක්‍යතාව (යහපත් දේ කිරීමේ හැකියාව) සහේතුකව සාක්ෂාත් කළ බුදු පියාණන් වහන්සේ ඉතා සරළ මටසිලිටු වදනින් පුද්ගලයා අකුසලයෙන් මුදවා කුසල් කිරීම සඳහා උත්සාහවත් කරවීමට මෙසේ වදාළහ.



"මහණෙනි, මම නුඹලාට අකුසල් අත්හැර දමන්න යැයි නො කියමි. අකුසල් අත් නොහැර සිටීමට බැරිකමක් තිබේ නම්, අකුසල් කිරීමෙන් නුඹලාට කිසියම් යහපතක් සිද්‍ධ වේ නම්, අකුසල් අත්හරින්නැයි කිසිවිටකත් නො කියමි. එහෙත් අකුසල් අත්හළ හැකිය. අකුසල් අත්හැරීමෙන් නුඹලාට යහපතක් ම සිදු වන නිසා අකුසල් අත්හරින්න යැයි කියමි. මහණෙනි, මම කුසල් වර්ධනය කරන්න යැයි නොකියමි. කුසල් වර්ධනය කිරීමට බැරි කමක් තිබේ නම්, කුසල් වර්ධන කිරීමෙන් නුඹලාට කිසියම් අයහපතක් සිදුවේ නම්, කුසල් වර්ධනය කරන්න යැයි කිසිවිටකත් නො කියමි. එහෙත් කුසල් වර්ධනය කළ හැකිය. කුසල් වර්ධනය කිරීමෙන් නුඹලාට යහපතක් ම සිදු වන නිසා කුසල් වර්ධනය කරන්න යැයි කියමි."[44]

මෙම ප්‍රකාශයෙන් අකුසලයෙන් වෙන්වී කුසලසම්පන්න වීමට භික්ෂුව සතු හැකියාව හා සම්පන්නකුසල ව සිටීමේ වැදගත්කම තව දුරටත් පැහැදිලි කෙරෙයි. බුදුසමය සමාජගත වීමේ මහඟු ප්‍රතිඵලය වූයේ තමන්ටත්, අන්‍යන්ටත්, මුළු මහත් සත්ව සංහතියටත් හිතසුව පිණිස පවත්නා සාරධර්ම සමුදායයක් කුසල ශක්තීන් ලෙස ව්‍යාප්ත කිරීමයි. නිරවද්‍ය පැවිදි ජීවිතයක් ගොඩනගා ගැනීමට අපේක්ෂා කරන්නා ද අනිවාර්යෙන්ම කුසල සම්පන්න විය යුතු බව මෙයින් තවදුරටත් සනාථ කර ඇත. පුහුදුන් මනස ලෝභ ද්වේෂ මෝහාදී ලාමක වූ ක්ලේශ ධර්මයන්ගෙන් අපවිත්‍ර වීම නිරායාසයෙන් ම සිදුවිය හැකිය. එසේ වී නමුත් නිවන් මගට පිළිපන්, යොනිසො මනසිකාරයෙන් යුත් භික්ෂුන් වහන්සේගේ නිරන්තර උත්සාහය විය යුත්තේ සිය සිත පවිත්‍රව තබා ගැනීමට ය. (සචිත්ත පරියොදපනං)[45] උපන් අකුසල් බැහැර කොට නූපන් කුසල් උපදවා ගැනීමටය. නූපන් අකුසල් නූපදවා උපන් කුසල්

වර්ධනය කිරීමටය. (සම්මා වායාම) සතර සතිපට්ඨාන සතර ඉද්ධිපාදා දී සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වර්ධනය කර ගැනීමටය.[46] ලෝභ ද්වේෂ මෝහාදී අකුසල චිත්තපාදයන් හා ප්‍රතිබද්ධ ව පුද්ගල අදක්ෂතාව තහවුරු කරමින්, ආසව - ඕඝ - යෝග - ග්‍රන්ථ - උපාදාන - නීවරණ - අනුසය - සංයෝජන - ක්ලේශ[47] යනා දී විවිධ විචිත්‍ර නාමයන්ගෙන් පෙනී සිටි පුද්ගලයාගේ ප්‍රකෘති මානසික තත්වය කෙලෙසමින් සසර බැඳ තබන අකුසල ධර්ම ප්‍රහාණය කිරීම පිණිස කුසලය තරම් තවත් ප්‍රබල සාධකයක් නො මැති බව කිව යුතුය.

කුසල යන්නෙහි ශක්‍යතාව, කාර්යක්ෂම බව හා මනෝඥභාවය යන අරුත් ඇති බව දනිමු. කෝසල්ල සංඛ්‍යාත ප්‍රඥාවෙන් සම්මිශ්‍ර වූ යම් ක්‍රියාවක් වෙයි ද එය කුසල ගණයට අයත් වෙයි. **කෝසල්ලං වුච්චති පඤ්ඤා තෙන සම්භූතත්ථං කුසලං**[48] ඒ අනුව සංසාරික වශයෙන් ලැබිය යුතු ඉෂ්ට ඵල අපේක්ෂාවන්ගෙන් තොරව, නිර්වාණාධිගමය පිණිස ඉවහල් වන්නා වූ ක්‍රියා කුසල් ලෙස ගැනේ. සදර්ථ සාධනය සඳහා පොහෝනා දක්ෂතාවත්, ඒ හා සුසැදි ප්‍රඥාවත් කුසලයෙහි දී පූර්වංගමව පවතී. එම නිසා අංග දසයකින් සමන්විත පුද්ගලයා කුශල සම්පන්නයෙකු ලෙස සමණමණ්ඩිකා සූත්‍රය[49] හඳුන්වා ඇත. ඒවා නම් ආර්ය මාර්ගයට අයත් සම්මාදිට්ඨි ආදී අංග අටත්, සම්මා ඤාණ, සම්මා විමුක්ති යන අංග දෙක සහිත වූ ශක්‍යතා දසය යි. එම සක්‍යතාවයන්ගෙන් සපිරි හෙතෙම පූර්ණ කුසල් ඇති, පැමිණිය යුතු උතුම් මාර්ග ඵල ධර්මයන්ට සපැමිණි, වාද විවාද ආදියෙන් නොසැලෙන, ප්‍රහීන කළ ආශ්‍රව ඇති භික්ෂුවක ලෙස හඳුන්වයි.

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙන් අර්ථවත් වන නිරවද්‍ය පැවිදි ජීවිතය නම් සම්පන්න කුසල පුද්ගලයෙකු වීමයි. කයින් වචනයෙන් සිතින් සිදු කෙරන සියලු අකුසල් දුරු කර සද්ධා වීරිය සති සමාධි පඤ්ඤාදී සියලු සක්‍යතාවයන්ගෙන් සමන්විත සම්පන්න කුසලයෙකු වීමයි. බුදුසමය විසින් නිර්දිෂ්ට අනුපූර්ව ප්‍රතිපදාවේ අවිච්ඡින්න අග්‍රඵලය



වන අර්හත්වයෙන් අභිෂේක ලැබීම සඳහා පූර්වෝක්ත කුසලය ම ස්වකීය සීලය බවට පත්කර ගත් පුද්ගලයාට හැකි වන බව වදාළේ එබැවිනි.

> "ආනන්දය, මෙසේ කුසල සීලයෝ නො විපිළිසර බව අර්ථ කොට අනුසස් කොට ඇත්තාහ. නො විපිළිසර බව ප්‍රමෝදය අර්ථකොට අනුසස් කොට ඇත. ප්‍රමෝදය ප්‍රීතිය අර්ථකොට අනුසස් කොට ඇත. ප්‍රීතිය පැහැදීම අර්ථකොට අනුසස් කොට ඇත. පැහැදීම සැපය අර්ථකොට අනුසස් කොට ඇත. සැපය සමාධිය අර්ථකොට අනුසස් කොට ඇත. සමාධිය යථාභූත ඥානදර්ශනය අර්ථකොට අනුසස් කොට ඇත. යථාභූතඥාන දර්ශනය නිවීම හා කලකිරීම අර්ථකොට අනුසස් කොට ඇත. නිවීම හා කලකිරීම විමුක්ති ඥානදර්ශනය අර්ථකොට අනුසස් කොට ඇත. ආනන්දය, මේ මේ ආකාරයෙන් කුසල ශීලයෝ අනුපිළිවෙළින් අර්හත්ව සංඛ්‍යාත අග්‍රඵලයට පැමිණීම පිණිස පවත්නේය.[50]

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය අනුව පුද්ගලයා තුළ පවත්නා භව්‍යතා දෙකක් පිළිබඳ හැඟීමක් ප්‍රකට වෙයි. එනම් හොඳ හෙවත් කුසල් කිරීමේ හැකියාව සහ නරක හෙවත් අකුසල් කිරීමේ හැකියාවයි. පුද්ගල මනස හැඩ ගැසී ඇති ඇගයීම් රටාව අනුව යහපතට හෝ අයහපතට නැඹුරු විය හැකිය. අකුසල පාක්ෂික ධර්මයන්ගේ බලපෑම් වලට අවනත වූ පුද්ගලයා පාප පව්ටු ලාමක ක්‍රියාවන් විෂයෙහි ඇදී යෑමේ සම්භව්‍යතාව අධිකය. බුදුදහම කුසලෙහි සාධනීය අගය නැවත නැවතත් ඉස්මතු කොට දක්වන්නේ එම ලාමක පව්ටු තත්වයෙන් ඔහු මුදා ගැනීම පිණිස ය. කුසලෙහි පවත්නා ප්‍රබලතම වැදගත්කම සීමිත වූ සදාචාරාත්මක සංකල්පයක් තුළට සීමා නොකර අසීමිත වූ අග්‍රඵලය හෙවත් අනුපාධිසේස පරිනිර්වාණය දක්වා වර්ධනය කළ හැකි බව

ඉහත බුදු වදනින් සනාථ කර ඇත. කයින් වදනින් සිතින් කුසලයක් කළ විට එය යෝනිසෝ මනසිකාරයෙන් නැවත නැවතත් ප්‍රත්‍යවේක්ෂා කොට ප්‍රමුදිත භාවයට පත්වන ලෙස කුඩා රාහුල හිමියන් දැනුවත් කළේ එම නිසාය.

සියලු අකුසල් ප්‍රහීණ කොට නික්ලේශී මානසිකත්වයෙන් සිටින බුදුරජාණන් වහන්සේ හා මහ රහතන් වහන්සේ "සම්පන්නකුසල" වශයෙන් සැලකෙති. පිනෙන් අර්ථවත් කෙරෙන භවගාමී බලාපොරොත්තු සියල්ල ක්ෂය කළ උන්වහන්සේලා පුඤ්ඤාභිසංඛාර (කාමාවචර - රූපාවචර කුසල චේතනා දහතුන) අපුඤ්ඤාභිසංඛාර (අකුසල චේතනා දොළොස) හා ආනෙඤ්ජාභිසංඛාර (අරූපාවචර කුසල චේතනා හතර) කිසිසේත් ම අභිසංස්කරණය නොකරති. (පින් පව් රැස් නො කරති) එහෙත් රාග දෝස මෝහා දී සියලු අකුසලයන් ක්ෂය කර සත්තිස් බෝධිපාක්ෂික ධර්ම ප්‍රවර්ධනය කිරීමට සමත් කුසලයෙන් පෝෂිතව සිටිති. එසේ හෙයින් වරක් ආනන්ද හිමියෝ කොසොල් රජු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් "මහරජ තථාගතයන් වහන්සේ සියලු අකුසල් ප්‍රහීණ කොට කුසල සම්පන්නව වැඩ වෙසෙති" යි[51] වදාළහ. බෞද්ධ සදාචාර ශික්ෂණය වරදවා වටහා ගත් ඇතැම්හු විමුක්ත පුද්ගලයා අයහපත පමණක් නොව යහපත ද ඉක්මවා ගිය අයෙකු ලෙස පෙන්වා දීමට උත්සාහ දරති. කුසල, අකුසල, සාවජ්ජ, අනවජ්ජ ආදී සියලු සාපේක්ෂක සංකල්පනා විමුක්ත පුද්ගලයා වෙත පැමිණ අර්ථශූන්‍ය වූ තත්වයට පත්වන බව ද ඔවුහු පවසති. ඒ වනාහි පින හා කුසලය අතර ඇති වෙනස නිසැකව වටහා නො ගැනීමෙන් ඇති වූ මනෝ විපල්ලාසයැකැ යි සිතමු.

---

[1] අසූ මහා ශ්‍රාවක ශ්‍රාවිකාවෝ, රඹුක්වැල්ලේ විපස්සි මාහිමි සංස්කරණය, 1998, පිටුව 99

[2] ම.නි. බු.ජ.ත්‍රි.මු. පිටුව 130

[3] ඛු.නි. 1, ඛුද්දකපාඨය, බු.ජ.ත්‍රි.මු. පිටුව 4

[4] ස.නි.3, බු.ජ.ත්‍රි.මු. (පඨම) පිටුව 232, (දුතිය) 234



[5] ම.නි. 3, බු.ජ.ත්‍රි.මු. පිටුව 574

[6] ම.නි. 2, බු.ජ.ත්‍රි.මු. පිටුව 142

[7] ස.නි. 5 - 1, නීවරණ සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 194

[8] ජා.පා. 1, හාරිත ජාතකය, බු.ජ.ත්‍රි.මු. පිටුව 332

[9] ම.නි. 1,සබ්බාසව සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 18

[10] ඛු.නි. පටිසම්භිදාමග්ග, බු.ජ.ත්‍රි.මු. පිටුව 400

[11] විසුද්ධිමග්ග, මාතර ශ්‍රී ධර්මවංශ මාහිමි සංස්කරණය 1996, පිටුව 574

[12] ථෙරගාථා, පාරාසරිය ථෙර, බු.ජ.ත්‍රි.මු. පිටුව 220

[13] ඉතිවුත්තක පාලි, ජීවිකා සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 442

[14] සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා 4, සේනාසනක්ඛන්ධකය, ස.හේ.මු. 1948 පිටුව 909

[15] දී.නි. 2, මහාපරිනිබ්බාන සූත්‍රය, අපරිහානීය ධර්ම, බු.ජ.ත්‍රි.මු. පිටුව 110

[16] සාරත්ථප්පකාසිනී, ස.නි. අටුවා (කස්සප සංයුත්තය) ස.හේ.මු. 1927, පිටුව 153

[17] මහවග්ග පාලි 1, ආචාරියවත්ත භාණවර, බු.ජ.ත්‍රි.මු. පිටුව 152

[18] අ.නි. 5, අට්ඨක නිපාතය, අනුරුද්ධ සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 130

[19] මහාවග්ග පාලි, 1, බු.ජ.ත්‍රි.මු. පිටුව 222

[20] මහාවග්ග පාලි, 1, රාහුල වත්ථු කථා, බු.ජ.ත්‍රි.මු. පිටුව 206

[21] මහාවග්ග පාලි, 1, බු.ජ.ත්‍රි.මු. පිටුව 180

[22] ම.නි. 1, මහාතණ්හාසංඛය සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 626

[23] පරමත්ථජෝතිකා, සුත.නි. අටුවා, මංගල සූත්‍ර වර්ණනාව, පිටුව 269

[24] අ.නි. 3, සෙබබල අග්ග සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 16

[25] සිංහල මිලින්ද ප්‍රශ්නය, ගලගම සරණංකර මාහිමි සංස්කරණය 1970 පිටුව 354

[26] ස.නි. 2, නිදාන වග්ග, දසබල සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 44

[27] ස.නි. 2, ලාභසක්කාර සංයුත්තය, බු.ජ.ත්‍රි.මු. පිටුව 344

[28] දී.නි. 2, මහා පරිනිබ්බාන සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 162

[29] පරමත්ථදීපනී, නාම උදානට්ඨකථා, ස.හේ.මු. 1920, පිටුව 152

[30] ම.නි. 2, ගුලිස්සානි සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 228

[31] ම.නි. 2, අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 134

[32] ධම්මසංගණිපකරණට්ඨකථා, ස.හේ.මු. 1940, පිටුව 295

02 MAY 2012

[33] අ.නි. 1, බු.ජ.ත්‍රි.මු. පිටුව 362

[34] විභංගප්පකරණය, ඛුද්දක වත්‍ථු විභඞගය, බු.ජ.ත්‍රි.මු. පිටුව 238

[35] අ.නි. 2, ජවාලාත සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 180

[36] ඥානපෝනික හිමි, කුසල් මුල් හා අකුසල් මුල් පරිවර්තනය
කේ.එන්.ඕ. ධර්මදාස, 2008, මහනුවර, බෞ.ග්‍ර.ප්‍ර.ස. පිටුව 3

[37] ම.නි. 2, බාහිතක සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 546

[38] අ.නි. 4, නිබ්බේධික සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 200

[39] උදම්විට ධම්මජෝති සංස්කරණය, 1962, අභිධම්මත්‍ථ සංගහෝ
නවනීත ටීකා, ධම්මානන්‍ද කෝසම්බි, පිටුව 18

[40] ඛු.නි. ධම්මපදය, පුප්ඵ වග්ග 10 වන ගාථාව

[41] පරමත්‍ථදීපනී, නාම උදානට්ඨකථා, ස.හේ.මු. 1920, පිටුව 223

[42] ම.නි. 1, සබ්බාසව සංවර සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 20

[43] ස.නි. 1, ජටා සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 26

[44] අ.නි. 1, දුක නිපාතය, බු.ජ.ත්‍රි.මු. පිටුව 114

[45] දි.නි. 2, මහාපදාන සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 96

[46] වි.ම. 22 පරිච්ඡේදය, ඤාණදස්සන විසුද්ධි නිර්දේශය, ස.හේ.වි.
පිටුව 509

[47] අභිධර්මාර්ථ සංග්‍රහය, පුරාණ සන්නය, සෝමාලෝක තිස්ස නාහිමි
සංස්: 1960, පිටුව 196

[48] දීඝනිකායටීකා (මහාවග්ග), සෝ.හේ.මු. 1967, පිටුව 513

[49] ම.නි. 2, බු.ජ.ත්‍රි.මු. පිටුව 374

[50] අ.නි. 6, කිමත්‍ථී සූත්‍රය, බු.ජ.ත්‍රි.මු. පිටුව 4

[51] ම.නි. 2, බාහිතක සූත්‍රය, පු.ජ.ත්‍රි.මු. පිටුව 546